# කුරුටු ගෑ සිත්තමක අරුත

පාට ගෑ සිත්තමක
සායම් කඩතුරාවෙන් වසා ගත්
කළු පැහැය,
ඔප කළ සුදු පැහැයට
මුළා නො වී

හිස් කඩදහියක
තේරුමක් නැති ව
කුරුටු ගෑ සිත්තමක
සදොස් තැන්හි
අරුත් විමසමි
සීරුවෙන් සීරුවට

මගක් නොදැන
ඔහේ පා ව ගිය නීරස
දිවියක අරුත
සොයන්නාට
මග කියන්නෙක් අවැසි ය

අඳුරු විජිතයකට
එළිය දෙන්නට
කණාමැදිරියෙක්
වුවමනා ය.

වාසි හා වහසි බස් අතර
තැවුලත්, වෙහෙසත්, විඩාබර දිවියත්
දැන් ගෙවී අවසන්
කඳුළු පුරවන් දෑස්
කෙවෙනි අග
දුක් වින්ද කාලයත්
දැන් ගෙවී අවසන්

සිතුවමේ අතරමං වුණු
මග සොයන්නාට
ඉතිරි කරමි ඉඟියක්,
දෑස් රිදවන තද
පාටක් වෙනුවට
අරුතක් ඇති ළා පැහැයක්....

ජී.ජී. දක්ෂිණා සෙව්වන්දි
දෙවන වසර,
සමාජ විද්‍යා අධ්‍යයනාංශය,
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
රුහුණු විශ්වවිද්‍යාලය.
dakshinasewwandi2000@gmail.com

9 772950 655005